# PPSC Circular No : AD/PD/AP&H/2024(3)

**<u>නැගෙනහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ</u>**
**<u>තනතුරට බඳවාගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2024</u>**

නැගෙනහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1840/51 හා 2013.12.13 දිනැති ගැසට් පත්‍රය මගින් පළකරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් කර ඇති විධිවිධානයන්ට අනුව දීප ව්‍යාප්ත මට්ටමින් පහත සඳහන් සුදුසුකම් සහිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය **2024.05.27** වේ.

**2. බඳවා ගැනීම සඳහා වන සේවා කොන්දේසි :-**

**2.1.** මෙම දැන්වීමට අනුව ඉල්ලුම් කරනු ලබන ශ්‍රී ලංකා සතත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ සේවයේ නියුතු නිලධාරීන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් සියල්ලම සම්පූර්ණ කර ඇති හා එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු ලබාදීමේ පරිපාටියකට අනුව අයදුම්කරුවන්ට ලකුණු ලබාදී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී උපරිම ලකුණු ලබාගන්නා අයදුම්කරු මෙම තනතුරට පත්කරනු ලැබේ.

**2.2. සුදුසුකම්**

**2.2.1.** පශු වෛද්‍ය විද්‍යා උපාධියක් සහිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ වසර 3 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම. (සුදුසුකම් සනාථ කිරීම සඳහා වන ලේඛන අයදුම්පත සමග අමුණා එවිය යුතුය.)

**සටහන : සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාල සියළු සුදුසුකම් (2024.05.27 දිනට හෝ එදිනට පෙර ) සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

**3. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

**3.1.** මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

**3.2. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති සංකේත අංකය නොමැති, අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර ඉදිරිපත් කර නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම අභ්‍යන්තර චක්‍රලේඛයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

**3.3.** අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශයේ ලේකම් සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ප්‍රධානියා විසින් නිර්දේශය කර එවිය යුතුය. පළාත් සභාවල සේවය කරන නිලධාරීන් අදාල පළාතේ ප්‍රධාන ලේකම්/ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ නිර්දේශය සහිතව එවිය යුතුය. සෑම අයදුම්පතකම එම අයදුම්කරු මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා නිදහස් කළ හැකි බව සඳහන් කොටස නිවැරදිව සම්පූර්ණ කර එවිය යුතුය.

**3.4.** නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024.05.27** වන දිනට හෝ ඊදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ තැපෑලෙන් එවන ලද අයදුම්පත් නැතිවුවහොත් ඒ පිළිබඳ වගකීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ. **(අයදුම්පත් ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැලකිය යුතුය.)**

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත,
කන්නියා පාර, වරෝදයනගර්, ත්‍රිකුණාමලය

**3.5.** අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **AD/PD/AP&H/2024(3) "නැගෙනහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්‍ෂ තනතුරට පත්කිරීම - 2024"** ලෙස සඳහන් කළ යුතුය.

**3.6.** ඉහත 2.1 වගන්තියේ ප්‍රතිපාදන වලට යටත්ව මෙම නිවේදනයෙහි සඳහන් සුදුසුකම් **2024.05.27** දින හෝ ඊදිනට පෙර සපුරා ඇති බවට සනාථ කෙරෙන ලියකියවිලි ඉදිරිපත් කරන සහ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන්, ඉහත සඳහන් කර ඇති ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. උක්ත සම්මුඛ පරීක්ෂණයට කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. **නියමිත සුදුසුකම් සපුරා නොගෙන මෙම පත්කිරීම සඳහා අයදුම්කිරීම වරදක් සේ සලකනු ලැබේ.**

**4. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව ඃ-**

සෑම අයදුම්කරුවකුම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

**5. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම ඃ-**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙද්දී හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ සැපයිය යුතු තොරතුරක් හිතාමතා සැපයීම පැහැර හැර ඇති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකදී ඔහුට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට හා ඔහුට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පිළිවන.

**6. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**
*ලකුණු ලබාදීමේ පිළිවෙළ :*

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| (i) ජ්‍යෙෂ්ඨතාවය | 40 |
| (ii) කුසලතාවය | 60 |
| මුළු ලකුණු | 100 |

**7.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් සඳහා වෙනත් දිනයකදී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

**8.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී පවත්වනු ලැබේ.

**9.** තම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සියලු ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදීම ඉදිරිපත් කළ යුතුය. ඉල්ලා ඇති නමුත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

**10.** මෙම නිවේදනයෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගන්නා තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම විභාගය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණයෙන් පිරවීම, කොටසක් පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා සතු වේ.

**ඒ. මන්සූර්,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.

දිනය : 07.05.2024